**යාපනය මහා නගර සභාව - 2022**

-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

යාපනය මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට යාපනය මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු වැඩ නිම කළ පිරිවැය රු.48,756,330ක් වූ ගොඩනැගිලි 09ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම තක්සේරු කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | වාහන 58ක වටිනාකම මෙන්ම, පරිත්‍යාග ලෙස ලද පුස්තකාල පොත් 7,341ක් හා රු.1,041,890කට මිලදී ගත් පුස්තකාල පොත් 3403 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරන බව. | -එම- |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ලෙජරයේ දක්වා තිබූ ජල ගාස්තු හා මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම ගාස්තු අතර රු. 647,883ක වෙනසක් පැවතුණි. | නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | වෙනස නිවැරදි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02ක් ඉක්මවූ ආපසු ගෙවිය යුතු ලංසු හා විවිධ තැන්පතු රු.6,884,107ක් නිරවුල් කර නොතිබුණි. | 2023 වර්ෂයේ නිවැරදි කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.333,243,645 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.272,824,761 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 83,307,232 | 103,721,112 | 81,043,388 | 163,748,515 | 78,177,486 | 106,880,895 | 84,150,616 | 140,874,328 |
| කුලී | 363,631,300 | 161,774,184 | 161,752,354 | 21,676,693 | 280,526,898 | 112,475,593 | 105,338,686 | 21,649,863 |
| බලපත්‍ර ගාස්තු | 25,842,000 | 29,901,290 | 30,322,058 | 398,000 | 24,332,000 | 25,849,019 | 29,322,712 | 818,767 |
| වෙනත් ආදායම් | 948,781,442 | 331,904,879 | 227,145,922 | 11,377,825 | 849,855,966 | 257,205,492 | 242,725,370 | 6,307,101 |
| | 1,421,561,974 | 627,301,465 | 500.263,722 | 197,201,033 | 1,232,892,350 | 502,410,999 | 461,537,384 | 169,650,059 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම්** | | |
| | වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරණි රු. 163,748,515ක් වූ හිඟහිටි වරිපනම් ශේෂයක් පැවැතිණි. | ආදායම් රැස් කිරීමේ නිලධාරීන් මාර්ගයෙන් සහ ජංගම සේවාවන් මගින් රැස්කිරීමට කටයුතු කර ඇති බව. | හිඟහිටි අයකර ගැනීම සඳහා ඵලදායි පියවර ගත යුතුය. |
| **(ආ)** | **බදු කුලී** | | |
| (i) | දීර්ඝකාලීනව බදු ලබාදුන් කඩකාමර 233ක් එහි හිමිකරුවන් නොවන පුද්ගලයින් විසින් පවත්වාගෙන යනු ලබයි. | සුදුසු ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | අදාළ ගිවිසුම් කොන්දේසි පරිදි කටයුතු කළ යුතුය. |
| (ii) | ගුරුනගර් වෙළෙඳපොළ සංකීර්ණයේ පිහිටි කඩකාමර 41ක් 2016 වර්ෂයේ | 2016 වර්ෂයේදී ලංසු කැඳවන ලද නමුත් කිසිදු අයෙකු බදු | අවශ්‍ය පහසුකම් සම්පූර්ණ කර නොපමාව ලංසු |

| | | | |
|---|---|---|---|
| | සිට වර්ෂ 06ක කාලයක් බදු ලබා නොදීම නිසා සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. | ගෙන නොතිබුණි. කඩකාමර පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් පහසුකම් නොමැතිවීම ඊට හේතුව වී තිබුණු බව. | කැඳවිය යුතුය. |
| (iii) | වර්ෂ 05කට හෝ වර්ෂ 03කට වරක් අලුත්කළ යුතු කඩකාමර 122කට අදාළ දීර්ඝකාලීන ගිවිසුම් කිසිවක් නැවත අලුත්කර නොතිබුණි. | නැවත අලුත් කිරිමට කටයුතු කරමින් පවතින බව. | ගිවිසුම් පරිදි කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් කඩ කාමර 17ක්, වෙළෙඳපොළක් සහ ප්‍රචාරක ගුවන් විදුලි සේවා 02ක් සමාලෝචිත වර්ෂයේදි ලංසු කැඳවා ලබා නොදීම හේතුවෙන් රු.12,245,171ක ආදායමක් අහිමි වී තිබුණි. | කුලියට ලබාගැනීමට කිසිදු අයෙකු ඉදිරිපත් නොවූ බව. | අදාළ අරමුණු සඳහා උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබුණු වර්ෂ 05ත් වර්ෂ 27ත් අතර කාලයක් පැරණි රු.6,983,066ක අත්තිකාරම් මේ දක්වාම අය කර ගෙන නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | අත්තිකාරම් නිරවුල් කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 01ත් වර්ෂ 10ත් අතර කාලයක සිට අභාවිතව පවතින වාහන 53ක් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි. | ඒවා පරීක්ෂා කිරීමට පළාත් යාන්ත්‍රික ඉංජිනේරුවරයාට අයැදුම් කර ඇති බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතුය. |
| (ආ) | 2015 ජනවාරි 01 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය අනුව අපහරණය කළ යුතු බවට තීරණය කළ වාහන 19ක්, පසුගිය වර්ෂ 02ත් වර්ෂ 04ත් අතර කාලයක සිට තවදුරටත් රඳවා ගෙන තිබුණි. | මාසයක් තුළ ක්‍රියාමාර්ග ගනු ලැබේ. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුය. |
| (ඇ) | පරිත්‍යාග ලෙස ලද වාහන 25ක අයිතිය පවරා ගෙන නොතිබුණි. | හිමිකාරිත්වය ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව. | සභාවට හිමිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1.1 ඡේදයට අනනුකූලව, සභාවට අයත් නොවූ ඉඩම් 45ක් තුළ සමාලෝචිත වර්ෂයේදී රු.36,604,935ක් වැය කර වෙළෙඳපොළවල් හා සංස්කෘතික මණ්ඩප ඉදිකර තිබුණි. | -එම- | වත්කම්වල අයිතිය නොපමාව නිරවුල් කරගත යුතුය. |
| (ඉ) | නවීන වෙළෙඳ සංකීර්ණයේ ඉහළ මහලෙහි 2017 වර්ෂයේ ඉදිකර තිබූ ශාලා 02ක් මේ දක්වා උපයෝජනය කර නොතිබුණි. | ලංසු කැඳවූ නමුත් කුලියට ලබාගැනීමට කිසිදු අයෙකු ඉදිරිපත් නොවූ බව. | අදාළ අරමුණු සඳහා උපයෝජනය කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත කාර්ය මණ්ඩලයට අමතරව 2014 වර්ෂයේ සෞඛ්‍ය කම්කරුවන් 10ක් සහ සේවිකාවන් 08ක් සභාව විසින් පත්කර තිබුණද, ඊට අවශ්‍ය අනුමැතිය පසුගිය වර්ෂ 08ක කාලය තුළ කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වරයාගෙන් ලැබී නොතිබුණි. | 2023 පෙබරවාරි 16 දින ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව. | නීතිරීතිවලට අනුකූලව ප්‍රසස්ත පියවරක් ගත යුතුය. |
| (ආ) | විශ්‍රාම ගිය, මිය ගිය සහ සේවයෙන් ඉවත්කර තිබූ නිලධාරීන් 154 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරණි රු.1,438,147ක් වූ හිඟණය ශේෂය ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය**

**පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානයට පාරිසරික බලපත්‍ර සහ සභාව විසින් නිපදවන පොහොර වෙනුවෙන් තත්ත්ව සහතිකයත් ලබා නොගැනීම නිසා පොහොර නිෂ්පාදන යන්ත්‍රය පසුගිය මාස 06ක සිට භාවිතා කර නොතිබුණි. | මෙම කරුණ පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | පාරිසරික බලපත්‍ර සහ තත්ත්ව සහතික ලබාගැනීමට කටයුතු කළ යුතු අතර අදාළ යන්ත්‍රය භාවිතා කිරීමටත් කටයුතු කළ යුතුය. |